ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව දිනය - 2023.01.27 වේලාව - පෙ.ව.9.00

**සහභාගි වූ ගරු මහජන නියෝජිතයින්**

1.ගරු සභාපති - කේ.ඩී.වසන්ත මැතිතුමා
2.ගරු උප සභාපති - ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**

3. ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා
4. කේ.ජී.සුමනතිස්ස ජයතිලක මැතිතුමා
5 ජී.මී.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා
6. ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
7. ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා
8. ඩබ්ලිව් .කතිකා දමයන්ති මැතිනිය
9. කේ.කේ.නිමල් විජේසූරිය මැතිතුමා
10 .එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා
11. ඒ.ජී.තිලකරත්න මැතිතුමා
12.ඩී.ඒ.සුනිල් දෙයියාගල මැතිතුමා
13.එම්.ඩබ්.හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා
14.එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා
15.ඩී.පි.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
16.ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා
17.ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා
18.එස්.සුදර්ශන් මැතිතුමා
19.එච්.ඒ.දිල්සානි ප්‍රශාදිකා මැතිනිය
20.කේ.මධුෂිකා ප්‍රශාදනි ජයසිංහ මැතිනිය
21.එම්.ඩී.ඥානවති මැතිනිය
22.ටී.ඉමල්කා සංජීවනි මැතිනිය
23.බී.සීතා රංජනි මැතිනිය
24.ඒ.පී.ඩබ්ලිව්.එම්.ඩයනා උදයංගනි මැතිනිය
25.කේ.කමල්රාජ් මැතිතුමා

**සහභාගි වූ නිලධාරීන්**

1.ලේකම් - දුමින්ද සී.වික්‍රමසිංහ මහතා
2. සංවර්ධන නිලධාරි - ආර්.එච්.සී.නිශාන්ති සෙනවිත්න

**ගරු මහ සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්.අමිල හේමන්ත මැතිතුමා
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණි සිටි සියළුම දෙනා පිළිගෙන විශේෂ සභාවේ කටයුතු පෙරවරු 9.00 ආරම්භ කරන ලදී.

**විශේෂ යෝජනා**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 01. අළුතින් ඉදි කිරිමට යෝජිත මාළු කඩය සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම වෙනුවෙන් 2023 අයවැය ලේඛනයේ 309 වැය ශිර්ෂයේ ප්‍රතිපාදන 509 වැය ශීර්ෂයට මාරු කිරිමේ යෝජනාව

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.මෙහි ඉඩම සම්බන්ධයෙන් ගැටළුක් තියෙනවා නම් ඒ අය කැදවලා සාකච්ඡා කරලා තීරණයක් ගනිමු.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, අපි ගියවර සභාවෙන් තීරණයක් ගත්තා මාළු කඩයක් ස්ථාපිත කරන්න.අපි මාළු කඩය හදන්නේ නඩු තියෙන ඉඩමක නෙමෙයි.මේක සභාව සතු ඉඩමක් මේක ගැටළුවක් නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, පුරනැගුම ගොඩනැගිල්ලේ තියෙන මාළු කඩය ළග ඉදන් තිබෙන පඩිපෙළ දිගටම හදන්න ඕන.එතන දොර ඉදිරිපස පැත්තට යොදන්න.නව මාළු කඩය හදන්න හදිසි වෙන්න එපා.මේ ගොඩනැගිල්ල ඉදි කරන එකට මගේ විරුද්ධත්වයක් නෑ. .නමුත් මම මගේ අදහස පැවසුවේ.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා තිබෙන මාළු ලැල්ල එතන සුදුසු නෑ කියලා ඔයාලම තමයි තීරණයක් ගෙන වෙනත් ව්‍යාපාරයක් සඳහා ටෙණ්ඩර් කරන්න කීවේ.අපි ඒක ටෙණ්ඩර් කළා.

**උප සභාපති ඒ.වි රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම ස්ථානයේ වහාන නැවතුම් ස්ථානයක් ඉදි කරලා තියෙනවා .පඩිපෙළක් යොදුවොත් නැවතුම් ස්ථානයක් කරගන යන්න බෑ.අපේ නගරයේ පුංචිම හරි ඉඩක් තියෙන එකම තැන තමයි මෙම ස්ථානය.වෙනත් ස්ථානයක මාළු කඩය ඉදි කරනවා නම් හොඳයි.එම ස්ථානයේ යොදා ගත්තොත් කිසිම ප්‍රයෝජනයක් ගන්න අමාරුයි.මේ සම්බන්ධයෙන් මගේ අදහසනම් මේ වෙලාවේ මෙම ස්ථානය සුදුසු නෑ කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එදා ඔබතුමන්ලා ගත්ත තීරණයක් තමයි මේ ක්‍රියාත්මක කරන්නේ,ජයතිලක මන්ත්‍රීතුමා කිව්ව එකත් හරි,නමුත් මේ පඩිපෙළ හදන්නත් ලොකු වියදමක් යනවා.අපට වාහන නැවතුම් ස්ථානයත් නැති වෙනවා.මෙම කාරණයේ දි ඔබතුමන්ලාට යම් බලයක් තියෙනවා ඒක ඉටු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම තීන්දුව ගන්න කොට සොයා බලා නිවරදි තීන්දුව ගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි,මෙම ස්ථානය ගැටළුවක් නැත්නම් මාළු කඩය ඉදිකිරීම හොඳයි.

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම කාරණාව සම්බන්ධයෙන් ලබන සභා වාරයට යෝජනාවක් ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,මේ කාරණය ලබන සභා වාරයට ඉදිරිපත් කරන්න.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව තීරණයක් ලබා ගැනීම සඳහා ලබන සභා වාරයට ඉදිරිපත් කරන බව ගරු මහ සභාවට නිවේදනය කරමි.

**ගරු සභාපති කේ.ඩී වසන්ත මැතිතුමා**
(ඉ) 02. පසුගිය මහ සභා තීරණ අනුව තෝරාගත් බදු කරු තීරණයට එකඟ නොවන බව දන්වා ඇති නිසා යටියන්තොට නව සති පොළ මාළු කඩය නැවත ටෙණ්ඩර් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා. නැවත ටෙණ්ඩර් කරන විට ස්ථානය සඳහන් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, රු.25000.00 ක තැන්පතුවක් තියාගෙන ටෙණ්ඩර් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි,නිමල් මන්ත්‍රීතුමාගේ යෝජනාව හොඳයි. රු.25000.00 ක් තැන්පතුව ගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**
ගරු සභාපතිතුමනි,ටෙණ්ඩර් විවෘත කරලා ඒ වෙලාවෙම තැන්පත් මුදල දෙන්න ක්‍රමයක් සකස් කරන්න පුළුවන්නම් හොඳයි.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාවට අනුව නව සති පොළ මාළු කඩය නැවත ටෙණ්ඩර් කරන්නත් රු.25000.00 ක තැන්පතුවක් තබා ගැනීමත් සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාවට අනුව නව සති පොළ මාළු කඩය නැවත ටෙණ්ඩර් කරන්නත් රු.25000.00 ක තැන්පතුවක් තබා ගැනීමත් ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 01)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 03. ජංගම අලෙවි කුටි තෝරාගත් බදු කරුවන්ට ලබා දීමේ ප්‍රසම්පාදන තීරණයට අනුමැතිය ලබා ගැනීම හා එම ගිවිසුමට අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 02)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
**(ඉ) 04.** 2023 වර්ෂයේ ප්‍රතිපාදන තුළින් පරුස්සැල්ල ප්‍රේමරත්න මහතාගේ නිවස අසල සිට සුනිල් ශාන්ත මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කර වැඩ අවසන් කර බිල්පත ඉදිරිපත් කර ඇත.එම බිල්පතට අනුව රු.200,000.00 මුදල ගෙවීම් කිරීම සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 03)**

අද දින විශේෂ සභාවට පැමිණ සභාවේ කටයුතු සාර්ථක කර ගැනිමට හැකි වීම පිළිබඳව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, කාර්යය මණ්ඩලයටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින් ප.ව 10.30 ට පමණ මහ සභා රැස්වීම අවසන් කරන ලදි.